# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1525/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 05/12/2023 පැය

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ව්‍යාජ අධ්‍යාපන ආයතනයක් වටලා එහි අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කල සැකකාරියක් අත්අඩංගුවට - බම්බලපිටිය පොලිස් ස්ථානය.**

2023.11.27 වන දින බම්බලපිටිය ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරු මත බම්බලපිටිය පොලිස් වසමේ ලෝරිස් පාර ප්‍රදේශයේ දී EVOLVE COLLEGE OF EDUCATION නමින් ව්‍යාජ ලෙස පවත්වාගෙන ගිය අධ්‍යාපන ආයතනයක් වටලා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 24 ක් වන ගිරිඋල්ල, නාරංගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

දේශීය හා විදේශීය රැකියා වලට අවශ්‍ය කරන ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා අධ්‍යාපනය ලබාදෙන බව **මුහුණු පොතේ දැන්වීම් පල කරමින්, දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් සිසුන් බඳවා ගනිමින්, වැඩමුළු පවත්වමින්, නිත්‍යානුකූල අනුමැතියකින් තොරව අධ්‍යාපනය ලබා දීමෙන් පසු මෙම ආයතනය මගින් ව්‍යාජ ඩිප්ලෝමා සහතික නිකුත් කර ඇත. එසේම මාර්ගස්ථ ක්‍රමයටද (online) අධ්‍යාපන වැඩමුළු පවත්වා ඇති බව නිරීක්ෂණය වේ. දේශීය** වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් අවශ්‍ය කරන නියමිත ප්‍රමිතීන්ගෙන් තොරව එම ආයතන පවත්වාගෙන ගොස් ඇති අතර එක් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා පාඨමාලාවේ වර්ගය අනුව රුපියල් 100,000/- සිට රුපියල් 445,000/- දක්වා මුදල් අයකරගෙන ඇති බවට අනාවරණය වී ඇති අතර මෙසේ වංචා සහගත ලෙස මුදල් ලබා ගැනීම සම්බන්ධව මේ වන විට පැමිණිලි 43 ක් වාර්තා වී ඇත.

තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමකින් තොරව අනවසරයෙන් ව්‍යාජව පවත්වාගෙන යනු ලැබූ ආයතනයක් බවට විමර්ශනයේ දී අනාවරණය වී ඇත. මෙම සැකකාරිය එම ආයතනයේ අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කර ඇති අතර දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මෙම

වංචා වලට හසු වූ පුද්ගලයින් 1000 ක ආසන්න පිරිසක් සිටින බවටත් මෙම ආයතනය මගින් විවිධ විද්‍යුත් මාධ්‍යයන් උපයෝගි කර ගනිමින් රැකියා අවස්ථා ලබා දීමට, උසස් අධ්‍යාපනයට දැන්වීම් පලකරමින් තවදුරටත් මුදල් එකතු කිරීමේ කටයුතු නිරතවන බවට වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත.

එම ආයතනයේ සම අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කරන ලද වයස අවුරුදු 25 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා බම්බලපිටිය පොලීසිය විමර්ශන සිදු කරනු ලබන අතර, මෙවැනි කාරණා වලදි වඩාත් විමසිලිමත්ව කටයුතු කරන ලෙසට පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**